# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2449/24 – 2025 අගෝස්තු මස 13 වැනි බදාදා – 2025.08.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2023/118.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.06.10 දිනැති හා අංක 2388/08 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.06.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගාල්ල, අගුළුගහ, පාරෙ ගෙදර පදිංචි පවිත්‍රා මහේෂාවී වනිගසේකර මෙය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/28/2024 හා 2025.07.23 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුලි මස 30 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ දී ය.

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

යොමු අංකය: IR/COM/02/2023/118
නඩු අංකය: A/28/2024

1. පවිත්‍රා මහේෂාවී වනිගසේකර මෙය,
පාරෙ ගෙදර,
අගුළුගහ,
ගාල්ල.

*පළමු පාර්ශ්වය*

එදිරිව

1. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
නො. 200,
කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

**බේරුම්කරණ ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ජේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා IR/COM/02/2023/118 හා 2024.06.04 වන දිනැති ලිපියෙන් බේරුම්කරු වශයෙන් මා පත්කොට ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

“ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ ගාල්ල ඩිපෝවේ ගිණුම් කාර්යාලයේ 2016.01.13 දින සිට 2016.07.12 දින දක්වා කිසිදු ගෙවීමකින් තොරව පුහුණුව ලබා මාස 06 ක පුහුණුව අවසන් කළ පවිත්‍රා මහේෂාවී වනිගසේකර මෙනවිය වෙත ස්ථිර පත්වීමක් ලබා නොදී සේවයේ අවශ්‍යතාව මත පුහුණු දීමනා පමණක් ගෙවමින් අඛණ්ඩව සේවය ලබා ගැනීම නිසා ඇයට යම් අසාධාරණයක් සිදුව තිබේද , එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ. ”

පළමුවන පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කාරිය සාක්ෂි ලබාදී ඇති අතර දෙවන පාර්ශ්වය වෙනුවෙන් නියෝජ්‍ය මානව සම්පත් කළමනාකරු සහ ප්‍රාදේශීය කළමනාකරු සාක්ෂි දී ඇත. ඉල්ලුම්කාරිය සිය දිවුරුම් ප්‍රකාශය මගින් ඇයගේ සාක්ෂිය තහවුරු කිරීමට උත්සහ කොට ඇත. ඇය විසින් ලේඛන 22 ක් ලකුණු කරමින් සාක්ෂි දී ඇත. ඉල්ලුම්කාරිය 2016.01.11 දිනැති ලිපිය මගින් 2016.01.13 දින සිට 2016.07.12 දින දක්වා මාස 6ක කාලයක් සඳහා පමණක් පුහුණුව සඳහා පත්කර ඇත. එකි ලිපිය A1 ලෙස ලකුණු කොට ඇත. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකාර තැන විසින් 2016.07.12 වන දින ලිපිය අනුව 2016.07.18 දින සිට 2017.01.17 දින දක්වා පුහුණු කාලය යලි දික් කොට ඇති අතර එකී කාලය තුළ රුපියල් 500.00 ක දීමනාවක් ගෙවා ඇත. එයට අදාල පත්වීමේ ලිපිය A2 ලෙස ලකුණු කොට ඇත. 2018, 2019 වසර සඳහා වැටුප්ද ලබාදී ඇති අතර A3, A4, A5 ලෙස ලකුණු කොට ඇත. නැවතත් ඉල්ලුම්කාරියට දෙවන පාර්ශ්ව ආයතනය විසින් 2020, 2021, 2022, 2023. 2024 වර්ෂ වල වැටුප් ලබාදී ඇති අතර එකී ලේඛන A6 සිට A10 දක්වා ලකුණු කොට ඇත. 2022.02.07 වන දින ඉල්ලුම්කාරිය විසින් සේවය ස්ථිර කරන ලෙස බලධාරීන්ගෙන් අයැද ඇති අතර එකි ලේඛනය A11 ලෙස ලකුණු කර ඇත. A12 ලෙස දක්වා ඇති ලේඛනය වන්නේ චක්‍රලේඛනයක් මත ද පොදුවේ සේවකයන්ට ලබාදෙන රුපියල් 1000.00 ක දීමනාව සම්බන්ධයෙනි. A13 ලෙස දක්වා ඇත්තේ චක්‍රලේඛන මත දීමනා ගෙවා නොමැති බවට ඉදිරිපත් කර ඇති ලේඛනයකි. A14 ලෙස දක්වා ඇත්තේ ස්ථිර තනතුරට අන්තර්ග්‍රහනය කිරීම සම්බන්ධයෙන් දක්වා ඇති ලේඛනයකි.

නැවතත් A15, A16, A17 ලෙස දක්වා ඇත්තේ 2024 ජූනි, ජූලි, අගෝස්තු මාසවල වැටුප් වලට අදාල ලේඛන වේ. A18 ලෙස දක්වා ඇත්තේ මෙම නඩු නිමිත්ත හා සබැඳි ලිපියකි. A19 දරන ලිපිය අදාළ වගඋත්තරකාර ආයතනයේ බලධාරින් අමතන ලද ලිපියකි. A20, A21, A22 දරන ලේඛන සුවිශේෂ වැදගත්කමක් පෙනේ. එහිදී අදාල ඉල්ලුම්කාරිය විසින් තමන්ට ලැබිය යුතු රුපියල් 2059395.00 ක හිඟ මුදල් අහිමි වී ඇති බවට ඇය විසින්ම අත්සන් කොට සාදන ලද ලේඛනයකි.

තවද දෙවන පාර්ශ්වය විසින් සිය සාක්ෂිකරුවන් දෙදෙනෙක් මගින් තමන්ගේ ස්ථාවරය ඉදිරිපත් කරන ලද අතර R1 දරන ලේඛනයෙන් දෙවන පාර්ශ්වය විසින් ප්‍රායෝගික පුහුණුව ලබාදීම සම්බන්ධයෙන් ලේඛනය ඉදිරිපත් කර ඇත. R2 ලේඛනය ප්‍රායෝගික පුහුණුව දීර්ඝ කිරීම සම්බන්ධ ලේඛනයකි. R3 දරන ලේඛනය ඉල්ලුම්කාරියව MA 1-1 තනතුරට බඳවා ගැනීම සම්බන්ධ ලේඛනයයි. R4 යනු වගඋත්තරකරුවන් විසින් සේවක අර්ථ සාධක අරමුදල් අධිභාරය අයකර ගැනීම සම්බන්ධ ලේඛනයකි. R5 යනු චක්‍රලේඛනයකි. R6 යනු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවකයන් සඳහා සිය කැමැත්තෙන් විශ්‍රාම යාමේ චක්‍රලේඛනයයි. R7 යනු අමාත්‍ය මණ්ඩල සංදේශයකි. R8 අමාත්‍ය මණ්ඩලයේ තීන්දු දැක්වෙන ලේඛනයකි. R9 ස්ථිර නොවන අනියම් සේවකයින් ස්ථිර කිරීම සම්බන්ධ ලේඛනයකි. මෙහිදී 401 වෙනියා ලෙස ඉල්ලුම්කාරියගේ නමද දක්වා ඇත. එවන් ආකාරයට දෙවන පාර්ශ්වය විසින් සිය ලේඛන ඉදිරිපත් කොට ඇත.

මෙහිදී සලකා බැලිය යුතු වන්නේ 2016.01.13 සිට 2016.07.12 දක්ව පුහුණුවට පැමිණි සේවකයා එම වසර 2016.07.12 වන දින සේවයේ ස්ථිර කිරීම හෝ පුහුණුව අවසන් කිරීමේ වගකීම රැඳී ඇත්තේ දෙවන පාර්ශ්වයේ ආයතනය වෙතය. අදාල ආයතනය එසේ නොකොට 2024 වර්ෂයේ ජුනි වන තෙක්ම අනියම් හෝ අස්ථිර සේවකයෙකු ලෙස සේවයේ යොදවාගෙන ඇත. එම තත්වය දෙවන පාර්ශ්වය ඉදිරිපත් කරන ලේඛන වලින්ද ඉල්ලුම්කාරිය ඉදිරිපත් කරන ලේඛන වලින්ද මනා ලෙස ඔප්පු වේ. මේ අනුව වසර 8කට අධික කාලයක් දෙවන පාර්ශ්වකාර ආයතනය විසින් ඉල්ලුම්කාරියව අනියම් සේවකයෙකු ලෙස සේවයේ යොදවා ඇත. මෙම තත්වය ඇයගෙ කම්කරු අයිතීන්වලට ඉතා අගති ලෙස හානි වී ඇත. පුහුණුවට බැඳී මාස 6 කින් පසුව දෙවන පාර්ශ්වකාර ආයතනය විසින් අනියම් සේවිකාවක ලෙස දිගින් දිගටම අඩු වැටුප් තලයේ පිහිටුවා සේවක අර්ථ සාධක අරමුදල්ද අඩු නොකොට ඇයගේ සියලු අයිතිවාසිකම් අහිමි කරමින් සේවයේ යොදවා ඇත. එසේ හෙයින් 2016.07.12 සිට ඉල්ලුම්කාරියගේ සේවය ස්ථිර විය යුතු බව මෙයින් නියෝග කර සිටී.

තවද ඇයට ලැබිය යුතු හිඟ වැටුප සම්බන්ධයෙන් ඉල්ලුම්කාරිය විසින් A20, A21, A22 දරන ලේඛන ඉදිරිපත් කොට ඇත. මෙය දෙවන පාර්ශ්වකාර ආයතනයේ නීතිඥවරිය විසින් තම හරස් ප්‍රශ්න වලදී අභියෝගයට ලක්කර ඇත. එය නඩු පොතේ 117 සහ 118 පිටුවේ මනා ලෙස දක්වා ඇත. එහිදී හරස් ප්‍රශ්න වලට උත්තර දෙමින් ඉල්ලුම්කාරිය මෙසේ කියා සිටි.

ප්‍ර : මෙම A20 දරන ලේඛනය උසස් පෙළ හැදෑරුවේ කුමන විෂය ධාරාවෙන්ද?

උ : වාණිජ විෂය ධාරාවෙන්.

ප්‍ර : මෙම A20 ලේඛනය ආයතනය විසින් සකස් කරන ලද ලේඛනයක්ද?

උ : නැහැ. මා විසින් සකස් කරන ලද ලේඛනයක්

ප්‍ර : ඒ අනුව මම තමාට යෝජනා කරනවා A20 ලේඛනය කිසිදු සාක්ෂිමය වටිනාකමක් නොමැති ලේඛනයක් කියලා?

උ : මගේ දැනුමේ හැටියට නිවැරදිව මම හදලා තිබෙනවා.

ප්‍ර : A20 ලේඛනය මොන චක්‍රලේඛනයක් භාවිතා කරලද පිළියෙල කරන තිබෙන්නේ?

උ : මෙය චක්‍ර ලේඛනයක් භාවිතා කරලා නෙමේ හදලා තිබෙන්නේ. 2024 අගෝස්තු මාසේ සාමාන්‍ය සේවකයෙක්ට ගෙවන වැටුප තමයි රු. 50,710.00

ප්‍ර : මෙම ලේඛනය ආයතනයේ වැටුප් අංශයෙන් තහවුරු වුණු ලේඛනයක් නෙමේ නේද?

උ : නැහැ. එය මගේ දැනුමේ හැටියට මා විසින් හදන ලද එකක්. මෙය වැරදි නම් නිවැරදි කරන්න කියලා නීතිඥ මහතාට ලිපියක් යැවුවා.

එහිදී A20 දරන ලේඛනය සම්බන්ධයෙන් විවාදිත තත්වයක් ඇති වී ඇති අතර දෙවන පාර්ශ්වයේ නීතිඥවරිය A20 දරන ලේඛන මොන වක්‍රලේඛන භාවිතා කර පිළියෙල කර තිබේද? යන්න විමසන විට ඉල්ලුම්කාරියගේ උත්තරය වන්නේ සාමාන්‍ය සේවකයෙකුට ගෙවන වැටුප රුපියල් 50,710.00 ක් බවයි. A20, A21 සහ A22 දරන ලේඛන සම්බන්ධයෙන් ඉල්ලුම්කාරියගේ ස්ථාවරය බිඳ හෙලීමට වගඋත්තරකාර පාර්ශ්වය සමත්ව නැත. මේ අනුව A20, A21 සහ A22 දරන ලේඛන පිළිගැනීමට සිදු වෙයි. මේ අනුව එකී ලේඛන පරිදි දක්වා තිබෙන රුපියල් 2059395.00 ක මුදල එනම් ඉල්ලුම්කාරිය A20, A21 සහ A22 දරන ලේඛනයන් මඟින් ඉල්ලා ඇති පරිදි 2017 ජනවාරි සිට 2024 ජුනි දක්වා ඉල්ලුම්කාරියගේ ස්ථිර නොවන කාලය තුළ ඉල්ලුම්කාරිය ලැබිය යුතු වැටුප බව මෙයින් තීන්දු කරමි. ඒ අනුව අද දින සිට මාස 3ක් ඇතුලත 2059395.00 (විසි ලක්ෂ පනස් නව දහස් තුන්සිය අනූපහ) ක මුදල නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බව නියම කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව සහතික කරමි.

**ආචාර්ය පාලිත සේනාධීර,**
කම්කරු අමාත්‍ය.

2025 ජුලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

EOG 08- 0127

---

මගේ අංකය: IR/COM/04/2020/140.

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.05.19 දිනැති හා අංක 2437/05 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.05.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බදුල්ල, විනීතගම, මලංගමුව, බෝගහවත්ත, සංස්කෘතික මධ්‍යස්ථානය අසල ලිපිනයෙහි පදිංචි එච්. වී. ජයරත්න මහතා සහ කොළඹ 05, කිරුල පාර, අංක 200 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/32/2025 හා 2025.07.15 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුලි මස 29 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ දී ය.

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

යොමු අංකය: IR/COM/04/2020/140
නඩු අංකය: A/32/2025

1. එච්. වී. ජයරත්න මයා,
සංස්කෘතික මධ්‍යස්ථානය අසල,
බෝගහවත්ත,
මලංගමුව,
විනීතගම,
බදුල්ල.

*පළමු පාර්ශ්වය*

එදිරිව

1. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක. 200,
කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශ්වය*

**බේරුම්කරණ ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව. එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩමාදුව, ද විලේජ් අංක 202/බී/61 හි පදිංචි නීතිඥ විජේසූරිය ආරච්චිලාගේ ජයවික්‍රම වන මා 2025.05.05 වන දින පත්කොට මා වෙත යොමු කර ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල්ගේ අංක IR/COM/04/2020/140 හා 2025.04.28 දිනැති ලිපියෙන් ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුව වශයෙන්,

" ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බදුල්ල ඩිපෝවේ සේවය කරන එච්.පි. ජයරත්න මහතාට විරුද්ධව පවත්වනු ලැබූ විනය පරීක්ෂණයෙන් අනතුරුව 2013.01.11 වන දින ලබාදුන් විනය නියෝගය මඟින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ" යනුවෙන් යොමුව දක්වා ඇත.

ඒ අනුව දෙපාර්ශ්වයම 2025.06.19 දින කැඳවූ අතර දෙපාර්ශ්වයටම මෙම බේරුම්කරණ විභාගය පවත්වාගෙන යන ආකාරය පැහැදිලි කර දුනිමි. ඒ අනුව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබාදී ඇති යොමුව නිවැරදි බව පළමුවන පාර්ශ්වකරු පිළිගත් අතර මෙම ආරාවුල සම්බන්ධව වෙනත් කිසිදු අධිකරණයක නඩුවක් නොමැති බව ප්‍රකාශ කරන්නට විය. මෙම බේරුම් කරණ විභාගය මාස 3ක් තුළ නිම කිරීමට අපේක්ෂා කරන බවත් දෙපාර්ශ්වයටම සිය ඉදිරිපත් කිරීම් දිවුරුම් ප්‍රකාශ මගින් හෝ ලිඛිත දේශන මගින් සිදුකළ හැකි බවත් පැහැදිලි කරමි. එමෙන්ම මෙම විභාගය අවසානයේ කිසියම් පාර්ශ්වයක් මූල්‍යමය සහනයක් අපෙක්ෂා කරන්නේ නම් එයද නිවැරදිව ගණනය කොට ප්‍රති පාර්ශ්වයට පිටපත් සහිතව ඉදිරිපත් කල යුතු බව පැහැදිලි කර දුනිමි.

අනතුරුව මෙම කාර්මික ආරාවුලට හේතුව පළමුවන පාර්ශ්වකරුගේ නියෝජිත පැහැදිලි කර දුන් අතර එහිදී පළමුවන පාර්ශ්වකරුට එරෙහිව ලංකා ගමනා ගමන මණ්ඩලයේ බදුල්ල ඩිපෝවේ පැවති විනය පරීක්ෂණයකින් අනතුරුව 2013.01.11 වන දින විනය නියෝගයක් ලබාදුන් බවත් පසුව ඊට අදාල අභියාචනයක් සිදු කර එය විභාග වීමෙන් අනතුරුව මණ්ඩලයට සිදු වූ අලාභය වෙනුවෙන් මුදල් අයකිරීමක් සිදුවන බවත් ප්‍රකාශ කෙරුණි. වසර ගණනාවක් මුදල් අයකිරීම් සිදු කරන බවත් අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කරන ලද ලේඛනයක් හේතුකොටගෙන සිදු කරන අයකිරීම් වලට අදාල සංඛ්‍යාවල නිවැරදි භාවය ප්‍රශ්න කරමින් මෙම ආරාවුල බේරුම්කරණයෙන් නිරවුල් කර ගැනීමට ඉදිරිපත් වූ බවත් කියා සිටී.

මෙහිදී දෙවන පාර්ශ්වය වෙනුවෙන් ප්‍රකාශ කොට සිටියේ පළමු පාර්ශ්වකරුට එරෙහිව විනය පරීක්ෂණය පවත්වා වසර 12 ක් පමණ කාලයක් ගතවී ඇති බවත් කාර්මික ආරවුල් පනතේ 44 ආ වගන්තියට පටහැනිව මෙම ඉල්ලීම සිදුකර ඇති නිසා එය මුල් අවස්ථාවේදීම ප්‍රතික්ෂේප කරන ලෙසත්ය.

පළමුවන පාර්ශ්වකරු වෙනුවෙන් කරන ලද ඉල්ලීම හා 2013.01.11 වන දින ලබාදුන් විනය නියෝගය අතර ඍජු සම්බන්ධතාවයක් මා හට අනාවරණය නොවීය. 2013.01.11 වන දින පළමු වන පාර්ශ්වකරුට එරෙහිව ලබාදුන් විනය නියෝගයත් 2013.04.09වන දින ලබාදුන් අභියාචනා නියෝගය පරීක්ෂා කල අතර එම නියෝග දෙකෙන් එකකවත් වැටුපෙන් අයකර ගැනීමක් සම්බන්ධව කිසිඳු සඳහනක් නොමැත. නමුත් පළමුවන පාර්ශ්වය කියා සිටින්නේ, 2018 සිට පළමු පාර්ශ්වකරුගෙන් වැටුපෙන් අයකර ගැනීමක් දිගින් දිගටම සිදු වූ බවත් එය මුල් විනය නියෝගයේ අතුරු ප්‍රතිඵලයක් බවත්ය. ඒ අනුව මෙම බේරුම්කරණ විභාගයට පළමුවන පාර්ශ්වකරු විසින් කරනු ලබන ඉල්ලීම සහ කම්කරු කොමසාරිස්වරයා විසින් මා වෙත ලබාදී ඇති යොමුව එකක් නොව දෙකක් බවත් තීරණය කරමි.ඒ අනුව පළමුවන පාර්ශ්වය කර ඇති ඉල්ලීම වලංගුභාවයක් නොමැති බැවින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරමි. පළමුවන පාර්ශ්වකරුට වැඩිදුරටත් උපදෙස් දෙනු ලැබුවේ ඔහුගේ වැටුපෙන් කිසියම් මුදලක් අලාභයක් වශයෙන් හෝ පාඩු පිරිමැසීමක් වශයෙන් අයකරනු ලබන්නේ නම් ඒ වෙනමම කාර්මික ආරාවුලක් වන අතර මුලින්ම ලංකා ගමනාගමන මණ්ඩලයේ අදාළ බලධාරීන් වෙත ඉල්ලීමක් කරන ලෙසය. ඒ අනුව පළමු පාර්ශ්වය විසින් කර ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

මෙම බේරුම්කරණ තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව ප්‍රකාශ කරමි.

**නීතිඥ ඩබ්. ඒ. ජයවික්‍රම,**
බේරුම්කරු.

2025 ජූලි මස 15 වැනි දින,
කොළඹ දී ය.

EOG 08- 0128

---

මගේ අංකය: IR/COM/05/2016/140.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.10.03 දිනැති හා අංක 2091/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.09.20 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තලංගම,කොස්වත්ත, සෙත්සිරි මාවත, අංක 259/9 (නව ලිපිනය, අංක 10, නගර සභා පටුමග, දෙහිවල) (සේවකයන් 20 දෙනෙකු වෙනුවෙන්) සහ අනෙක් පාර්ශ්වය වශයෙන් පේරාදෙණිය, ගන්නෝරුව, තැ.පෙ. 09 හි පදිංචි ශ්‍රී ලංකා හදබිම අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/67/2018 හා 2025.07.11 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූලි මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ දී ය.

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදීය.

යොමු අංකය: IR/67/2018
නඩු අංකය: IR/COM/05/2016/140

1. අන්තර් සමාගම් සේවක සංගමය,
අංක: 259/9, සෙත්සිරි මාවත,
කොස්වත්ත,
තලංගම (සේවකයින් 20 දෙනෙකු වෙනුවෙන්),

*පළමු පාර්ශ්වය*

එදිරිව

1. ශ්‍රී ලංකා හදබිම අධිකාරිය,
තැ. පෙ. 09,
ගන්නොරුව,
පේරාදෙණිය.

*දෙවන පාර්ශ්වය*

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මැති තුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමඟ කියවා ) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අනපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2018.02.20 දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුලට තුඩු දුන් කාරණය:-.

බේරුම් කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ඒ. විමලවීර මහතා විසින් 2018 සැප්තැම්බර් මස 10 වන දිනැතිව ඒවා ඇති ලිපියේ දැක්වෙන්නේ.

ශ්‍රී ලංකා හදබිම අධිකාරියේ දීර්ඝ කාලයක් සේවයේ නියුතු ටී. එස්. ටී. රත්න කුමාර ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 20 දෙනා ස්ථිර නොකිරීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ සිදුව තිබේ ද යන්න හා එසේ සිදුව තිබේ නම් හිමි විය යුතු සහන මොනවාද? හිමිවිය යුතු වැටුප කුමක්ද යන්න පිළිබඳ වේ.

1. එස්. ටී. රත්නකුමාර
2. ආර්. එන්.ඩී. ටී.ඩබ්.ආර්.එච්.එම්.ජේ.යටවර
3. ඕ.ජී. අනුෂා උදයංගනී කුමාරි
4. ඩබ්. ඩී. චන්ද්‍රරත්න
5. එස්. ජ්. එස්. කුමාර මයා
6. එස්. ඒ. එන්. අසෝකා
7. ඩබ්. එම්. යූ. සී. ජී. සී. කේ. වික්‍රමසිංහ
8. එන්. ජ්. එම්. ඉන්ද්‍රානි ඒකනායක
9. එච්. එම්. එච්. ඒ. සන්දිලිගම
10. එච්.ඒ. ආර්. කංකානම්ගේ
11. ආර්.ඒ.එරන්දිකා ඉන්දුමති රණසිංහ

12. සී. ඒ. ජී. එස්. කුමාර
13. වයි.එම්.සී.ඩී. ඒකනායක
14. එන්. එච්. ධනුෂ්ක චන්දිමාල් මධුරංග
15. ඒ. ඒ. පී. ලීපගේ
16. එච්. ජී. රසිකා ප්‍රියංගනී කුමාරි
17. පි.ජී. ගාමිණි රූපසිංහ
18. ජී. ජී. බී. ගාමිණි බණ්ඩාර
19. යූ.පී.කේ.කුමාර නවරත්න
20. ඒ. එම්. අයි. එල් විජේරත්න

පසුබිම සහ නඩු කාර්ය පරිපාටිය :-

01. මෙම නඩුව විමසීමට ගැනීමට පෙර දෙපාර්ශ්වයේම ලිඛිත ප්‍රකාශ කැඳවා ඇත. වග උත්තරකාර පාර්ශ්වය සිය ලිඛිත ප්‍රකාශනය 2018.11.07 දින ඉදිරිපත්කර ඇති අතර ඉහත කි සේවකයන් ශ්‍රී ලංකා හදබිම අධිකාරිය යටතේ පවත්නා අලෙවි ප්‍රවර්ධන ව්‍යාපෘතියට බඳවාගෙන ඇති බව පෙන්වාදී ඇත. එකී සේවකයන්ට ස්ථිර පත්වීම් ලබාදීමට කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමුකර ඇති බවත් එහිදී තනතුරු නාමවල පරස්පර විරෝධිතාවයක් ඇති හෙයින් සේවයේ ස්ථිර කල නොහැකි වූ බවත් ප්‍රකාශ කර ඇත. එසේ වුවද පසුව මෙම ව්‍යාපෘතිය සමුපකාර සමිතියක් ලෙස ලියා පදිංචි කොට සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ එහි අනපනත් සහ විධි විධාන වලට යටත්ව ලියාපදිංචිකර ඇති බව ප්‍රකාශ කර ඇත. තවද පසුව සමුපකාර කොමිෂන් සභාවේ චක්‍රලේඛ අනුව ස්ථිර පත්වීම් ලබාදිය හැකි බවද ප්‍රකාශ කර ඇත.

කෙසේ වුවද අන්තර් සමාගම් සේවක බල මණ්ඩලය ඉහත කී සේවකයන් 20 දෙනා වෙනුවෙන් සිය ප්‍රකාශය 2018 11.23 දින ඉදිරිපත් කර ඇති අතර, එකී සේවකයන් විසින් ආයතනයට තම සේවාවන් මඟින් විශාල ප්‍රතිලාභයක් ලබාදෙන නමුත් සේවකයන්ට තනතුරු පිරිනැමීමක් සිදු නොකොට සේවය ස්ථිර නොකර ආයතනය අත්තනෝමතිකව කටයුතු කරන බව දක්වා ඇත. කෙසේ වුවද මෙම මූලික ලිඛිත ප්‍රකාශ සහ ප්‍රතිප්‍රකාශ මඟින් දෙපාර්ශවය කරුණු පැහැදිලි කිරීමෙන් පසු දෙපාර්ශ්වය අතර සමථයක් නොවූයෙන් පැමිණිල්ල විභාගයට ගන්න ලදී. 2019.07.02 සිට 2023.11.21 දක්වා කාලය තුල නඩු වාර කිහිපයක් මඟින් මෙම නඩුව විභාගයට ගත අතර රටේ පැවති වසංගත තත්වයන් සහ ගමනාගමන අර්බුදය මත කඩු විභාග පැවැත්වීම ප්‍රමාද වී ඇත.

කෙසේ වුවද මෙම නඩු විභාගයන් අතරතුර නඩුවාර කිහිපයකදී දෙපාර්ශ්වය සමඟ වැඩි දුරටත් සාකච්ඡා කිරීමේදී මෙම නඩුවට අදාළ පැමිණිලිකරුවන් 20 ක් සිටියද මේ වන විට සක්‍රියව ඉදිරිපත්වන්නේ 13 දෙනෙකු පමණක් බැවින් ඔවුන් පිළිබඳව සමථයක් ඇතිකර ගැනීමට දෙපාර්ශ්වය එකඟ විය. ඒ අනුව දෙපාර්ශ්වයේම සමථ යෝජනා ඉදිරිපත් වූ අතර පහත පරිදි පැමිණිල්ල සමථයට පත්කර ගැනීමට දෙපාර්ශ්වය එකඟ විය.

එනම් 1971 අංක 45 දරන සේවය අවසන් කිරීමේ පනත යටතේ වර්ෂ 2005 මාර්තු මස 15 දිනැතිව අංක 1384/07 දරන අති විශෙෂ ගැසට් නිවේදනයට අනුව හඳුන්වාදී ඇති වන්දි සූත්‍රයට අනුව වන්දි ගණනය කර සේවකයන්ට ගෙවීමට දෙපාර්ශ්වය එකඟත්වයක් ඇතිකර ගන්න ලදී.

**ප්‍රදානය**

1. මෙහි එක් පැමිණිලිකාරියක් වන ඕ.ජී. ඒ.යු කුමාරි යන අය වන්දියක් නොලබා නැවත සේවය ලබා ගැනීමට එකඟ වූ අතර ඇයට කළමනාකාර සහකාර (තාක්ෂණික නොවන) - 111 ශ්‍රේණියට පත්වීම් ලබාදීමට එකඟ වූ අතර එසේ කිරීමට නියම කරන ලදී. එකී නියමය අනුව 2023.10.20 දින එම තනතුර පිරිනමා ඇති බව ගරු බේරුම්කරණය වෙත දන්වා ඇත

2. සමථය පරිදි අනෙකුත් පැමිණිලිකරුවනට පහත පරිදි වන්දි මුදල ගෙවීමට එකඟ වී ඇති අතර එය චෙක්පත් 2023.11.21 දින චෙක්පත් මඟින් ගෙවීමට එකඟ විය. ඒ අනුව අදාල ගෙවීම්කර එය බේරුම්කරණය වෙත දන්වන මෙන් නියෝග කරන ලදී. එකී නියමය පරිදි මුදල් ගෙවා ඒ බව බේරුම්කරණය වෙත දන්වා එවා ඇත.

| පැමිණිලිකරුගේ නම: | ගෙවීමට එකඟ වූ වන්දි මුදල (රු.) |
|---|---|

| | | |
|---|---|---|
| 1. | ඩබලිව්. චන්ද්‍රරත්න | 182250.00 |
| 2. | ටී. බී. ඒකනායක | 171400.00 |
| 3. | සමීර මීපගේ | 162700.00 |
| 4. | චමිල සම්පත් | 175150.00 |
| 5. | රසිකා ප්‍රියංගනී කුමාරි | 162700.00 |
| 6. | එන. අශෝකා | 168900.00 |
| 7. | තුමාලි නවරත්න | 170600.00 |
| 8. | ඉෂානි විජේරත්න | 173630.00 |
| 9. | ඉන්ද්‍රානි ඒකනායක. | 172650.00 |
| 10. | ගීතානි චන්ද්‍රිකා | 172650.00 |
| 11. | එරන්දිකා ඉන්දුමතී රණසිංහ | 163700.00 |
| 12. | ශාමලී සන්දිරිගම | 169150.00 |

3. මෙම සමථ නියෝගය මහනුවර දකුණ කම්කරු කාර්යාලයට යොමුකරන ලෙස නියම කරමි. ඉහත නියෝගය යුක්ති සහගත සහ සාධාරණ නියෝගයක් බව වැඩිදුරටත් ප්‍රකාශ කරමි.

**එච්. එම්. අනුලාවතී,**
බේරුම්කරු.

2025 ජුලි මස 11 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 08 – 0129

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.